# සිංහල සාහිත්‍යාගත රාමායණය

## මහාචාර්ය තිස්ස කාරියවසම්

රාමායණය භාරතයෙහි සංස්කෘතයෙන් ලියැවුණු ආදි කාව්‍යය ලෙස සලකන වීර කාව්‍යයයි. එහි කතුවරයා නමින් වාල්මීකි වුවත්, ආදි කවි ලෙස හැඳින්වුවත්, ඔහු මං පහරන්නෙකියි කියති. එසේ වුවත්, රාමායණය භාරතීය හින්දු ජනතාවගේ ජීවිතයට සුසමාදර්ශ සැපයූ කාව්‍ය ග්‍රන්ථයකි. එහි ශ්ලෝක 24000 කි. කාණ්ඩ හතකි. අවසාන කාණ්ඩය රාමායණයට අයිති නැතැයි ද කියති. ඒ මුල් කාණ්ඩ නම් බාල කාණ්ඩය, අයෝධ්‍යා කාණ්ඩය, අරණ්‍ය කාණ්ඩය, කිෂ්කින්ධා කාණ්ඩය සහ සුන්දර කාණ්ඩයත් ය. හත්වැන්න උත්තර කාණ්ඩයයි.

රාම හින්දු ආගමේ ශ්‍රී විෂ්ණු දෙවියන්ගේ දස අවතාරයෙන් හත්වැන්න ලෙස සලකනු ලැබේ. එහෙයින් වෛෂ්ණව භක්තිකයන්ගේ පූජාවට සුදුසු ඔහු අපරිමේය ගුණ සමුදායකින් යුක්ත පුරුෂෝත්තමයෙකි.

මේ ග්‍රන්ථයෙහි ප්‍රභවයට හේතු වන්නේ තුන් ලොව දන්නා නාරද මුනිවරයා විසින් වාල්මීකි රුසිවරයාගෙන් විමසන ලද ප්‍රශ්නයට පිළිතුරක් සැපයීමයි. ලෝකයේ ප්‍රශංසනීය වූ ගුණ ඇති පිරිස දුර්ලභයහ. එවැනි ගුණ සහිත මිනිසෙකු ගැන මම ඔබට කියමි.

මෙවැනි ගුණ ගැන කියන්නට උපකාරයට ගත් කතාන්තර සමූහය අග්නිදිග ආසියාවේ තායිලන්තයේ සියම් රාමායණය නමින් ද, කාම්බෝජය, වියට්නාමය වැනි රටවල ගැමි නාටක විලාසයෙන් ද ප්‍රචලිතය. භාරතයෙහි සංස්කෘතයෙන් පමණක් රචිත මේ කෘතිවලද රාමායණ කතාව විස්තර වෙයි.

| | |
|---|---|
| ශ්‍රී භාසගේ | ප්‍රතිමා නාටකය සහ අභිෂේක නාටකය |
| භවභූතිගේ | මහා වීර චරිතය සහ උත්තම රාම චරිතය |
| මුරාරිගේ | අනර්ඝරාඝවය |
| රාජශේඛරගේ | බාල රාමායණය |
| භාස්කර ගේ | උන්මත්තරාඝව |
| මහාදේව ගේ | අද්භූත දර්පණය |
| කල්හණගේ | රාජතරංගිණි |

සර්ග 20 කින් බැඳුණු ජානකීහරණය නම් මහා කාව්‍යයක ද රාමසීතා කතාව එයි. එහි විශේෂය එය ශ්‍රී සිංහලස්‍ය කුමාරදාස්‍ය කාතෞ ජානකීහරණේ මහාකාව්‍යෙ විංශතිඃ සර්ග සමාප්තිමගමත් යනුවෙන් අවසාන වීමයි. සිංහල ජනශ්‍රැතියට අනුව මේ කවියා ලංකාවේ වාසය කළ අතර ඔහු කාලිදාස මහ කවියාගේ මිතුරෙකි.

රාමායණයෙහි සීතා පැහැර ගෙන ගියේ ලංකා නම් දේශයෙහි රාවණ රජුය. මේ ලංකාව අප ජීවත් වන ශ්‍රී ලංකාව ලෙස ගන්නෝ සිටිති. කාව්‍යය ආශ්‍රය කර ගෙන ඉතිහාසයක් ගොඩ නැගීමට හැකි නම් එය වාසිදායකය. එහෙත් එවැනි තීරණයකට ඒමට විද්‍යාත්මක සාධක තිබිය යුතුය.

මා ඉහත සඳහන් කළ රාමායණ කතාව සඳහන් ග්‍රන්ථවල මෙන්ම රත්නාවලී, කතා සරිත්සාගර සහ කාව්‍ය මීමංසා වැනි කෘති වලද ලංකාව ගැන සඳහනක් ඇත. එහෙත් මේ ග්‍රන්ථ හැම එකකම නාම මාත්‍ර වශයෙන් කියැවෙන්නේ සිංහලද්වීප යන පදයයි. සීතා-රාම කතාව කවියට නැගූ කවියාද තමා ශ්‍රී ලංකාවාසියෙකු නම් එයට සිංහලද්වීප- සිංහලස්‍ය කුමාරදාසස්‍යයයි කීමට අවශ්‍යතාවක් නැත. ලංකා යන පදය අපේ මව්බිම වෙනුවෙන් යෙදෙන්නේ සිංහල විශුද්ධිමාර්ග සන්නයේ සහ දළදා සිරිතෙහි ද 13-14 වැනි සියවස්වලය. පොලොන්නරු යුගයේ සෙල්ලිපිවලද එසේමය.

මේ සාධක අනුව රාමායණයේ එන ලංකා යනු දූපත යන අරුතැති පදයකි. එය ශ්‍රී ලංකාව විය නොහැකිය.

## II

ශ්‍රී ලංකාවේ ක්‍රි.ව. 5 වැනි ශතකයෙහි රාමායණය ගැන සඳහන් වී තිබේ. එය සිංහල සාහිත්‍යයට නොව පාලි සාහිත්‍යයට සම්බන්ධ වූවකි. මෙහි වැඩම කළ බුද්ධඝෝෂාචාර්යයන් වහන්සේ අටුවාකථා-අට්ඨකථා-රචනා කරන්නාහු මජ්ඣිම නිකාය මූල පණ්ණාසකයට අයත් සම්මා දිට්ඨි සූත්‍රයට අර්ථ කියන තැන සම්ඵප්පලාපො අකුසලං යන පද දෙක මෙසේ විස්තර කරති. භාරතයුද්ධ සීතාහරණාදිනිරත්ථකථාපුරෙක්ඛාරතා